# සුරැකිය යුතු පුවක් ගස

**කරුංකා ගෙඩියක් තරම් කුඩා කොණ්ඩයක් බැඳගන බුලත්, පුවක්, හුණු, දුංකොළ, ඇතුළු කළමනා යොදා සරු කොට ගත් බුලත් විටකින් දෙතොල් රතු** පැහැ ගන්වා ගත් ගැමියා එදා පෙන්නුම් කළේ නිර්ව්‍යාජ දේශීය ගැමි සංස්කෘතියේ රැඳී තිබුණු අපේකමයි. විසි එක්වන සියවස දෝතින් වැළඳ ගන්නට සූදානම්ව ඉන්න අපෙන් පැරැන්නන් අගය කළ කොණ්ඩය බැඳීමේ ලක්ෂණය පවා කඩිනමින් මැකී යමින් පවතිනවා.

කොහොම වුනත් මගුල් ගෙදරට මෙන්ම අවමගුල් ගෙදරටත් හේනට, කුඹුරට වගේම තොවිල් පවිල් පිටියටත්, බණට පිරිත් මඩුවට මෙන් දානෙ ගෙදරටත්, එක්වන අමුත්තන් වෙනුවෙන් සකස් කෙරුණු බුලත් තට්ටුව අපේ සංස්කෘතියේ නැතිවම බැරි අංගයක්. අවුරුදු දහස් ගණනක් තිස්සේ බුලත් විට කෑමෙන් පැවත ආ මේ සිරිත තවත් කොතෙක් කලක් අපේ සමාජය තුල පවතීවි ද යන්න අද සාකච්ඡාවට භාජනය කළ යුතු වැදගත් ප්‍රශ්නයක් බවට පත් වෙලා. පසුගිය කාලය තුළ දේශීය පුවක් වගාවට ඇති වුණු විවිධ බලපෑම් මත වෙළඳ පලේ දේශීය පුවක් ගෙඩියක මිල රු. 4.00 ක් තරම් ඉහළට නැගුණා. අද වෙළඳ පොලේ පුවක් ගෙඩියක මිළ අපට දරා ගන්න පුළුවන් තරම් පහල බැහැල තිබුණත් පසු ගිය අවුරුදු තුනක කාල සීමාව තුල අපේ පුවක් අපනයනය ගැන විමසා බලන කොට නම් අනාගතය ගැන සතුටු වෙන්න පුළුවන් තත්ත්වයක් නැහැ.

**පුවක් ගසේ පැවැත්මට නීත්‍යානුකූල බවක් නොලැබීමේ හේතුවෙන් විශාල වශයෙන් කපා දැමීම් වලට ලක් වේ.**

| වර්ෂය | අපනයන ධාරිතාවය මෙ.ටො. | අපනයන ආදායම රු. දසලක්ෂ |
|---|---|---|
| 1991 | 2885.2 | 92.4 |
| 1992 | 648.7 | 32.8 |
| 1993 | 122.3 | 8.7 |

මේ කාල සීමාව තුළ අපේ රටේ පැවතුණු අයහපත් දේශගුණ තත්ත්වයත් පුවක් නිෂ්පාදනය අඩු වීමට එක් හේතුවකි. ඒත් මේ බලපෑම තාවකාලික එකක්. යළිත් හොඳ දේශගුණික තත්ත්වයක් ඇති වෙන කොට පුවක් නිෂ්පාදනය ඉහළ යාමක් ගැන අපට බලාපොරොත්තු ඇති කර ගන්න පුළුවනි. පුවක් වගාවේ පරිහානියට බලපාන අනෙක් ප්‍රධාන සාධකය වෙන්නේ ඉවක් බවක් නැතිව මහා පරිමාණයෙන් කෙරෙන පුවක් ගස් කපා දැමීම. අපේ රටේ වටිනා දැව වගී ලෙස නම් කළ ගස් වගී රාශියක් කපා දැමීමේදී විධිමත් අවසරයක් බලධාරීන්ගෙන් ලබා ගත යුතුව තිබෙනවා.

**ඒත් පුවක් ගසේ පැවැත්ම එසේ නීත්‍යානුකූල බවක් නොලැබීමේ හේතුවෙන් විශාල වශයෙන් බිම හෙළීමට ලක් වෙනවා.** තාවකාලික නිවාස, මඩු සෑදීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍යයක් ලෙස විවිධ අන්දමින් යොදා ගන්නා නිසා පුවක් ගස කපා හෙලනවා. පොලවෙන් මැණික් කැට මතු කර ගන්න, කැපෙන පතල් සකස් කර ගන්න තවත් ගස් ප්‍රමාණයක් කැපෙනවා. උත්සව සභාවල වේදිකා සකස් කරන්නනත් තොරණ සදන්නත් වාර්ෂිකව කැපෙන පුවක් ගස් ප්‍රමාණය ඉතාමත් ඉහළයි. විවිධ හේතූන් මත වාර්ෂිකව විශාල පරිමාණයෙන් කෙරෙන පුවක් ගස් කපා දැමීමේ මේ සිරිත අපි තවදුරටත් අනුගමනය කළොත් කොණ්ඩය බැඳි ගැමියා වගේම පුවක් ගසත් කෞතුක වස්තුවක් වීම වලක්වන්න අපහසු වේවි.

**පුවක් අත්තෙ ඉරටු වලින් සකසා ගත් ඉලපත ගේ දෙරේ ඇතුලත හා පිටත අමදින්න යොද ගැනුනා.**

ඉහතින් දක්වපු සටහනේ විදිහට 1991 - 1993 දක්වා ගත වූ කාලය තුල ගෙවුන සෑම ආදායම් වසරකදීම අපනයන ආදායමත්, අපනයන පරිමාවත් ඊට පෙර අවුරුද්දේ තිබුණු ප්‍රමාණයෙන් 1/4 දක්වා අඩු වීමක් දක්නට ලැබෙනවා. අපනයන ආදායමේ හා අපනයන පරිමාවේ දක්නට ලැබෙන මෙම අවනතිය ඒ භෝගය මුහුණ දී ඇති ඛේදජනක තත්ත්වය මනාව විදහා දක්වනවා.

පුවක් ලංකාවේ තෙත් කලාපය තුළ විශාල වශයෙන් ප්‍රචලිත ව ඇති ශාකයක්. විශේෂයෙන්ම මැද රට තෙත් කලාපයේ ඇති කෘෂි වනාන්තතර තුලත්, පහත රට තෙත් කලාපයේ ගෙවතු වල ඇති මිශ්‍ර වගාවන්ගේත්, ප්‍රමුඛ ශාකයක් ලෙස නම් කරන්නත් පුළුවනි. මෙයට අමතරව තෙත් කලාපයෙන් පිටත සමහර ප්‍රදේශයන් වලත් සරු පුවක් වගාවන් දක්නට ලැබෙනවා. මිශ්‍ර වගා ලෙස මිස තනි වගා ලෙස පුවක් වගාව ප්‍රචලිත නොවීමේ හේතුවෙන් දිවයින තුල පුවක් වගාව යටතේ සංවර්ධනය වී ඇති බිම් ප්‍රමාණය පිළිබඳව නිවැරදි දත්තයන් සපයා ගැනීමට අපහසුයි. පුවක් වගාව යටතේ සංවර්ධනය වී ඇති බිම් ප්‍රමාණය ගැන විතරක් නොවේ, වාර්ෂික පුවක් නිෂ්පාදන ධාරිතාවය ගැනත් දේශීය පාරිභෝජන සීමාවන් පිළිබඳවත් පැහැදිළි සටහන් ලබා ගැනීමට අපහසුව තිබෙනවා.

පුවක් දිවයින තුල දීර්ඝ කාලයක් තිස්සේ ව්‍යාප්තව තිබුණත් මෙම භෝගය ගැන කළ විධිමත් අධ්‍යයනයන් නැති තරමයි. මේ හේතුව නිසා මෙම භෝගයේ තෝරා ගත් ප්‍රභේදයන් පිළිබඳව සඳහන් වන්නේ නෑ. ඒත් ගෙඩියේ පිටත වර්ණය, ගෙඩියේ හැඩය හා ගෙඩි වල ඇති මත්වීමේ ගුණයේ ඇති වෙනස්කම් අනුව විවිධ පුවක් ප්‍රභේද හඳුනාගත හැකි වෙනවා. දේශීය පුවක් වගාවන්ගේ දැකිය හැකි මෙම වෙනස්කම් වලට අමතරව හම්බන් පුවක්, රට පුවක් ආදී නම්වලින් හඳුන්වන මෙරටට ආගන්තුක පුවක් වගී දෙකක් දක්නට ලැබෙනවා. මෙම වගී දෙක අනෙකුත් දේශීය වගීයන් අතුරින් වෙන් කොට පැහැදිළිව හඳුනා ගන්න පුළුවනි. පුවක් පැලයක් අලුතින් සිටුවා අවුරුදු හතකදී විතර කාලයක් තුල සතුටුදායක අස්වැන්නක් ලබා දෙන ගස් වල අස්වැන්න ඉන් පස්සෙ ක්‍රමයෙන් අඩු වී යනවා.

වාර්ෂිකව අපනයනය කරන පුවක් ප්‍රමාණය අපි නෙලා ගන්නේ ක්‍රමානුකූලව කළ වගාවන් ගෙන්වත් දැඩි වෙහෙසක් දරා නඩත්තු කළ වගාවන්ගෙන්වත් නොවේ. නිදැල්ලේ වැඩුන පුවක් ගස් වලින්. නැත්නම් පුවක් අරඹවල් වලින්. කිසිදු සාත්තු සප්පායමකින් තොරව තිතැතින්ම තමන්ට සපයා ගත හැකි ජලය, පෝෂ්‍ය ද්‍රව්‍ය, හිරු එළිය වැනි ස්වභාවික සම්පත් උපයෝගී කර

ගෙන පුවක් ගස නිපදවන පුවක් ගෙඩිත්, ඒ ගසුත් අපි අපේ ප්‍රයෝජනයට ගන්නවා. 1991 දී රුපියල් දස ලක්ෂ 90 කට අධික විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගන්න ලැබුණේ අපේ ඉඩම් වල නිදැල්ලේ වැවෙන පුවක් ගස් වලින් ලබා ගන්නා ගෙඩි අපනයනය කරලා. ඒ විතරක් නෙවෙයි, පසුගිය කාලේ දේශීය වෙළඳ පලේ පුවක් මිල බෙහෙවින් ඉහළ ගිය කාලේ පුවක් අලෙවිය මගින් රුපියල් ලක්ෂ ගණනින් ආදායම් උපයා ගන්නත් අපේ අයට ඉඩ ලැබුණේ පුවක් ගෙඩියෙන්. පුවක් කියන්නෙ බීජ අපනයනය කරල විදේශ විනිමය උපය ගන්නවත්, අමු පුවක්, කරුංකා, මඩ පුවක් විදිහට සකස් කර ගෙන බුලත් විටක අඩු පාඩු මකා ගන්නවත් විතරක් ප්‍රයෝජනවත් වෙන ශාකයක් නොවේ. පුවක් ගසේ විවිධ කොටස් වලින් අපේ පැරැන්නන් ලබා ගත්ත ප්‍රයෝජන සියල්ලම අද අපි ලබා නොගත්තත්, තවමත් පුවක් ගසෙන් අපි ලබා ගන්න ප්‍රයෝජන අති විශාල වෙනවා. තාවකාලික මඩු, වරිච්චි ගෙවල් වල රාමුව, ගෙයක පියස්ස, කුකුල් කූඩු, එළු ගාල් ආදිය සකස් කරන කොට විතරක් නෙවෙයි, පතල් කර්මාන්තයේදීත් ප්‍රයෝජනයට ගන්නේ පුවක් ගසේ කඳ. අවුරුදු උත්සවයට තරුණයන්ගෙ ශක්තිය දක්ෂතාවය උරගා බලන්න සකස් කරන ලිස්සන ගහ, කොට්ට පොර ගැසීමේ අට්ටාලය ආදිය සකස් කරන්න ප්‍රයෝජනවත් වෙන්නේ පුවක් ගසේ කඳ. අපේ පැරැන්නන් ජල සම්පාදනයට පිහිලි ලෙස යොදා ගත්තෙත් පුවක් ගසින් පලා සකස් කරන ගත්ත පළුවක්. පිරිත් කොටුව සරසන්න, පිදේනි තට්ටුව සරසන්න, තොවිල් පවිල් කටයුතු වලට යොදා ගත්තෙ පුවක් මල. බත් මුල් බඳින්න, පැණි මුල් සකස් කරන්න, කිතුල් ගසේ මලින් වැහෙන තෙලිජ්ජ ටික එකතු කර ගන්න යොදා ගත්තේ පුවක් අත්තේ කොළපත. ගෙවල් වල ඇතුලත වගේම පිටත අමදින්න ඉලපත සකස් කර ගත්තේ පුවක් අත්තේ කුරු වලින්. ඒ විතරක් නෙවෙයි, එක් අයෙක් කොළපතේ ඉඳ ගෙන ඉන්න කොට පුවක් අත්තේ අනෙක් කෙළවරින් තව කෙනෙක් ඇද ගෙන යාමේ කොළපත් පැදීම අදත් ගම්බද පැතිවල කුඩා දරුවන් අතර ඉතාමත්ම ජනප්‍රිය ක්‍රීඩාවක්.

**පුවක් වගාව සංවර්ධනය කිරීම, තනි පුද්ගලයෙකුටවත් එක් රාජ්‍ය ආයතනයකටවත් තනිව කළ හැකි දෙයක් නොවේ.**

**මේ අවුරුද්ද තුළ තුන් ලක්ෂ හැත්තෑපන් දහසක පමණ පැල ප්‍රමාණයක් දිවයින තුළ අළුතින් සිටුවීමට ඉලක්ක කර තියෙනවා.**

ගවයන් සඳහා කරන වෙදකම් වලිනුත්, මිනිස් අපිට ඕන කරන ඖෂධ නිෂ්පාදනයේදීත් අපේ දේශීය වෙද ඉසි වරයින් පුවක් ගසෙන් ලබා ගන්නා නොයෙක් කොටස් භාවිතා කළා. මෙම තත්ත්වයන් ගැන විමසිලිමත් වෙන කොට අපිට පෙනී යන වැදගත් කරුණක් තමයි, දැනට රටේ තියෙන සරු පුවක් ගස් ටික ආරක්ෂා කර ගන්නවා වගේම වැඩි අස්වැන්නක් ලබා ගන්න පුළුවන් විදිහේ පුවක් වගාවක් අළුතින් ආරම්භ කිරීමත්, යුගයේ අවශ්‍යතාවයක්ය කියන එක.

මේ හේතුව නිසාම අපේ රටේ පුවක් වගාව සංවර්ධනය කරන්න විශේෂ වැඩ පිළිවෙලක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මේ අවුරුද්දෙදි දියත් කරල තියෙනවා. මේ වැඩ පිළිවෙල යටතේ උසස් අස්වැන්නක් දෙන, හොඳ ලක්ෂණ අඩංගු වෙන, තෝරා ගත්ත මව් ගස් වලින් ලබා ගන්න බීජ වලින් නිෂ්පාදනය කළ පුවක් පැල 10 බැගින් පුවක් වගාවට ලැදියාවක් දක්වන පිරිස අතරේ නොමිලයේ බෙදා හැරෙනවා. මෙයට වැඩි පුවක් පැල ප්‍රමාණයක් වගා කරන්න උනන්දු වෙන අයට පැලයක් රුපියල් 2.50 ක සහන මිලක් යටතේ අවශ්‍ය තරම් පුවක් පැල ලබා ගන්නත් ඉඩ කඩ ලබා දීල තියෙනවා. දෙපාර්තමේන්තුව මේ අවුරුද්ද තුල තුන් ලක්ෂ හැත්තෑපන් දහසක පමණ පැල ප්‍රමාණයක් දිවයින තුල අළුතින් සිටුවීමට ඉලක්ක කරල තියෙනවා. මේක පුවක් වගාව දිවයින තුළ සංවර්ධනයේ ලා ගන්න කෙටි කාලීන පියවරක් විතරයි.

**කරුංක ගෙඩියක් තරමට කොණ්ඩය බැඳි කාල වකවානුව වියැකී යමින් තිබේ.**

මෙයට අමතරව පුවක් වගාවේ ජාන සම්පත් ඒක රාශි කිරීමේ වැඩ පිළිවෙලකුත්, වගාවට අදාල පූර්ව හා පශ්චාත් අස්වනු තාක්ෂණය පිළිබඳ විධිමත් අධ්‍යයනයක් කිරීමත් දෙපාර්තමේන්තුව මගින් දැනටමත් ආරම්භ කරල තියෙනවා. මෙම පියවරවල් ගැනීමේ අරමුණ වන්නේ දීර්ඝ කාලීනව පුවක් වගා සංවර්ධනයට අවශ්‍ය වන පියවර සපුරා ගන්න එක. පුවක් වගාව විධිමත් විදිහට නොකළ නිසා අපි වැඩි දෙනෙකුට ඒ වගාව පිළිබඳව තියෙන්නේ අඩු දැනුමක්. මේ නිසා දැනට තමන් සතු පුවක් වගාවන් පිළිබඳව යමක් අළුතින් දැන ගන්නත් අළුත් වගාවක් ආරම්භ කිරීමේදී අවශ්‍ය වන තාක්ෂණය ඔබට ලබා ගන්නත් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු යොදල තියෙනවා. පුවක් වගාව සම්බන්ධව ඔබට අවශ්‍ය තොරතුරු ඔබේ ප්‍රදේශයේ ඉන්න අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි වෙතින් ඔබට නොමිලයේ ලබා ගන්න ඉඩ කඩ සලස්වලා තියෙනවා.

**පුවක් වගාව සංවර්ධනය කිරීම, තනි පුද්ගලයෙකුටවත් එක් රාජ්‍ය ආයතනයකටවත් පමණක් කළ හැකි දෙයක් නොවේ.** හැම දෙනාගේම අවබෝධය, කැපවීම, උනන්දුව, මත මෙම වගාවේ අනාගත පැවැත්ම සුරක්ෂිත කරන්න අපිට හැකි වේවි. එමගින් මෙතෙක් වසර දහස් ගණනක් අපට ප්‍රයෝජනවත් වූ ආකාරයෙන්ම තවත් වසර සිය ගණනක් තුල පුවක් ගසින් ප්‍රයෝජනවත් යමක් අප වෙනුවෙන් කෙරෙනු ඇති.

**ගාමිණී වීරකෝන්**

ප්‍රචාරක අංශය,
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
1095, පේරාදෙණිය.